# චින්තාමාණික්‍ය රත්නය නම්වූ සංක්ෂිප්ත භෛෂජ්‍ය ගුරු බුද්ධ පූජාව

පරිවර්තක
ඩබ්ලිව්. එම්. ගුණතිලක

# චින්තාමාණික්‍ය රත්නය නම්වූ සංක්ෂිප්ත භෛෂජ්‍ය ගුරු බුද්ධ පූජාව

ප්‍රථම මුද්‍රණය : 2015

I S B N

© ඩබ්ලිව්. එම්. ගුණතිලක

ප්‍රකාශනය :

පිටකවරය, අක්ෂර සංයෝජනය හා මුද්‍රණය :
ලක්කොම් ප්‍රින්ට්
නො. 88, පැපිලියාන පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දුරකථන : 0112 825 666
www.lakcom.lk

# චින්තාමාණික්‍ය රත්නය නම්වූ සංක්ෂිප්ත භෛෂජ්‍ය ගුරු බුද්ධ පූජාව

(පංචෙන් ලොසං ච්යොකි ග්‍යල්ට්සන් විසින් රචනා කරන ලදී.)

## ගුරු මුනීන්ද්‍රයන්ට නමස්කාර වේවා !

ඔබ වහන්සේගේ නාමයන් නැමති ගංගාව ඇසුණු පමණින් අවීචි මහා නරකාදියේ ගිනි පවා නෙළුම් පොකුණ මෙන් සිසිල්ව යන්නේය. පිරිහෙන යුගයේ ආරක්‍ෂකයන් වූ සත් බුදුන්වහන්සේලාගේ සහ ශාක්‍ය මුනීන්ද්‍රයන්ගේ පා යුග මම නමස්කාර කරන්නෙමි.

නානා වැදගත්කම් ඇති කාර්යයන් නිසා විසිරීගිය සිත් ඇති මාගේ මෙන්ම පිරිහෙන යුගයේ සත් බුදුවරයන්ගේ ජීවිත කතා ගැන විශ්වාසය ඇති අන් අයගේ යහපත තකා මෙම පූජා අමෘත සූත්‍රයේ කැටි ගැසුණු සාරය ඉදිරිපත් කරමි.

මෙම පිරිහෙන යුගයේදී භෛෂජ්‍යගුරු බුදුන් වහන්සේගේ බලය ද ආශීර්වාදය ද වර්ධනය වී ඇතැයි ආර්ය බුදුන්වහන්සේ දේශනා කොට ඇති බැවින් අපිද එය පිළිගනිමු. මෙම පූජා සූත්‍රයේ කියා ඇති ආකාරයට සියලු දේ (ද්‍රව්‍ය) සූදානම් කර ගැනීමෙන් පසුව, පිරිහෙන යුගයන්හි ආරක්‍ෂකයන් වූ සත් බුදුන්වහන්සේලාගේ ලයාදර කැපවීම අවදි කර ගැනීමේ මෙම සාරමය පූජාව පැවැත්වීමට අදහස් කරන පුද්ගලයා තම මනස සරණාගමනයෙන් හා බෝධිචිත්තයෙන් සම්පූර්ණයෙන් පුරවාගෙන මෙසේ සජ්ඣායනා කළ යුත්තේය.

## සරණ යාම හා බෝධි චිත්තය

තුන් කල්හි සහ දස දිසාවන්හි වැඩ වෙසෙන සියලුම තථාගතයන්වහන්සේලාගේ සිත, කය, වචනය ද සද්ගුණයන් ද, ක්‍රියාකාරීත්වය ද සම්පූර්ණයෙන් ඇතුළත් වන්නා වූ සොබාදහම ද, අසූහාර දහසක් ධර්මස්කන්ධය ද,
ආර්ය සංඝයාගේ ස්වාමියා ද වන

මම කාරුණික හා කීර්තිධර ශුද්ධ වු මුල හා පරම්පරා ගුරු උතුමන් සරණ යමි.
මම භාග්‍යවත් සම්‍යක් සම්බුදුන්වහන්සේලා සරණ යමි.
මම ශුද්ධ වු ධර්මය සරණ යමි.
මම ආර්ය සංඝයා සරණ යමි.
මම සුඛයට පත් වූ සොහොයුරන් අට දෙනා ද, සරණ යමි

පිරිවර දේවතාවන් පිරිවරාගත් භෛෂජ්‍ය ගුරු තථාගතයන් වහන්සේලා ද සරණ යමි.
මම කීර්තිධර ශුද්ධ වූ ආරක්‍ෂකයන් ද, ප්‍රඥා ඇස විවර වූ ධර්මාරක්‍ෂකයන් ද සරණ යමි.

මා බුදුන් දැක නිවන් දකිනා තෙක්ම
මම බුදුන්වහන්සේ ද, ධර්‍මයද, ආර්ය සංඝයා ද සරණ යමි.
දානය ආදී (සය) පාරමිතාවන් සම්පූර්ණ කිරීමෙන් මට ලැබෙන පිනෙන්
මම සියලු ජීවි සත්‍වයන්ගේ හිත සුව පිණිස
බුදුවරයෙකු බවට පත් වෙම්වා!

## සතර අපරිමාන ධර්ම

තමා හා පෙනෙන්නට ඇති සියලු දේ ස්වභාවයෙන්ම ධර්මධාතුව ම වුවත්, එය මෙතෙක් ප්‍රත්‍යක්‍ෂ නොකළ ජීවී සත්වයින් සතුටට

හා සතුටේ හේතුව බවට ද පත් කරමි.
මම දුකෙන් හා දුකට හේතුවෙන් වෙන් කරමි.
මම දුක නොමැති සතුටෙන් වෙන්කළ නොහැකි බවට පත් කරමි.
මම, යහපැවැත්මේ හේතුව වූ ද, ආශාවෙන් තොර වූ ද, පිළිකුලෙන් තොර වූ ද, පක්ෂපාතීත්වයෙන් තොර වූ ද උපේක්ෂාවෙන් යුතු වෙමි.

## විශේෂ බෝධි චිත්තය

සියලු මාතෘ ජීවි සත්වයන්ගේ හිත සුව පිණිස, මම සම්මා සම්බුද්ධත්වයට පත් විය යුත්තෙමි. එබැවින් දණ්ඩ නමස්කාර කිරීමෙන් ද, පූජා පැවැත්වීමෙන් ද සුඛයට පත් භෛෂජ්‍යගුරු බුදුන්වහන්සේලා වූ සොයුරු අපට දෙනා වහන්සේලාට ළයාදාර ආයාචනයන් කිරීමෙන් ද (ධර්ම) මාර්ගයේ පියවරයෙහි යෙදෙන්නට යන්නෙමි.

## ස්ථාන පවිත්‍ර කිරීම

බුදුන්වහන්සේලාගේ හා බෝසතුන්වහන්සේලාගේ ආශිර්වාදය නැමති පරම සත්‍යයේ බලයෙන් කුශල, ප්‍රඥා දෙකේ බලයෙන් හා ධර්මධාතුවේ පවිත්‍රත්වයේ බලයෙන්, මෙම ලෝකයේ ජීවි සත්වයන් හා පරිසරය, සුඛාවතී ලෝකයේ මෙන් සංසාරයේ හා නිර්වාණයේ මනාප පාරමිතාවන්ගෙන් පරිපූර්ණ වේවා!

## පූජා වස්තු

ගස් සහ පොකුණුවලින් අලංකාර වූ මාණික්‍යමය භූමිය පතුල රන්, රිදී, මුතු, සුණු වලින් වැසී ඇත.
මලු විසුරුවා ඇත, සඳුන් සුවඳ පැන නගී,
මිනිස් හා දිව්‍යමය විනෝදයන්,
සමන්තභද්‍රයන්ගේ පූජාවස්තූන් සෑම තැනම ඇත.

*           *           *

එහි මනරම් මැණික් මාළිගය මැද
නෙළුම්මල් හා සිංහාසන මැද,
බුදුවරු ද බෝසත්වරුද වැඩ වෙසෙති.
උන්වහන්සේලා සතුටුවන ආකාරයට
සෑම තැනම දාන වස්තු සමූහයන් (වලාවන්) නැමති
සාගරයන්ගෙන් පිරී යේවා,
ඒවා උපන්නේ මන්ත්‍ර, සමාධි හා ප්‍රණිධාන වල බලයෙනි.

*           *           *

## වලා මන්ත්‍ර පූජාව

මෙම මන්ත්‍රයෙන් දාන වස්තුවල ප්‍රමාණය අසීමිත ලෙස වර්ධනය වේ.
ඕං නමෝ භගවතේ වජ්‍ර සාර ප්‍රමර්දනේ
තථාගතායාර්හතේ සම්‍යක්සම්බුද්ධාය
තද්‍යථා ඕං වජ්‍රේ මහා විද්‍යා වජ්‍රේ
මහා බෝධිචිත්ත වජ්‍රේ මහා බෝධි -
මණ්ඩෝපසංක්‍රමණ වජ්‍රේ සර්ව කර්ම
ආවරණ විශෝධන වජ්‍රේ ස්වාහා.

## සත්‍යයේ බලය

ත්‍රිවිධ රත්නයන්ගේ සත්‍යයේ බලයෙන් සියලු බුදුවරුන්ගේ හා බෝසතුන්ගේ ආසිරි බලයෙන් .................... මේ සියලු පූජා එසේම වේවා !

*           *           *

## අතිරේක විස්තෘත සංස්කරණය

දුර්ලභ ත්‍රිවිධ උත්තමයන්ගේ සත්‍යයේ බලයෙන්, සියලු බුදුවරුන්ගේ හා බෝසතුන්ගේ ආසිරි බලයෙන්, පරිපූර්ණ කරන ලද කුශල, ප්‍රඥා ධනයේ බලයෙන් සහ පවිත්‍ර වූ ද අචින්ත්‍ය වූ ද සංසිද්ධි ක්ෂේත්‍රයේ බලයෙන්, ආර්ය සමන්තභද්‍ර, මංජු ශ්‍රී වැනි බෝසත්වරුන්ගේ විපර්යාස බලයෙන් පැන නගින්නා වූ ආකාසය සේ සිතාගත නොහැකි හා නොසිඳෙන මෙන් පූජා වලාකුළු රාශිය පැනගීවා, දස දිසාවන්හි වෙසෙන බුදුන්වහන්සේලාගේ හා බෝසතුන් වහන්සේලාගේ නේඉයන් තුළ පිළිගනු ලැබේවා!

## ආයචනය (සුවඳ කූරු දල්වමින්)

පිරිහිගෙන යන යුගයන්හි කාරුණික ආරක්ෂකයන් වූ
සත් බුදුවරයන්වහන්සේලාණෙනි,
ශාක්‍යමුනීන්ද්‍රයාණෙනි, ශුද්ධ වූ ධර්මයාණෙනි,
බෝසතවරුනි, ආරක්ෂකයිනි,
අන් අයට හා මා හට උදව්කරුවන් ලෙසද,
ආරක්ෂක සරණ ලෙසද කැඳවනු ලැබූවා වූ
ඔබ වහන්සේලා මෙහි අවුත් රැස්වී
තමන්වහන්සේලාගේ ආශීර්වාදයෙන් ප්‍රදානය කරන සේක්වා !

## (සප්තාංග) -අංග සතේ පුහුණුව ප්‍රණිපාතයන් (නමස්කාරයෙන්)

අසමසම කරුණාවෙන් යුතු මූලගුරු උතුමාණන්ට,
මෙම අසමසම සූත්‍රය අතේ දරාගෙන සිටින
මංජු ශ්‍රී, ශන්තරක්ෂිත ආදී ශාක්‍ය රජතුමන්ට හා
ඍජු හා පාරම්පරික ගුරු උතුමාණන්වහන්සේලාට
මම නමස්කාර කරමි.
අසරණ ජීවී සත්වයන් විමුක්තියට පත් කරන
මහා කාරුණිකයාණන්වහන්සේලාට,

සත් බුදුවරයන්වහන්සේලාට, ශාක්‍යමුනි බුදුන් වහන්සේට, ශුද්ධ වූ ධර්මයාණන්ට,
මංජු ශ්‍රී, ක්‍යබ් ඩ්‍රොල්, වජ්‍රපානී, බ්‍රහ්ම හා ඊශ්වර යන අයට සහ
මහාරාජයන්ට ද යක්ෂයන්ට ද මාගේ නමස්කාරය වේවා.

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන් සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්ම සකස් වී නිකුත් වන්නට සලස්වමි, (විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා, පාපෝච්චාරණය කරමි, ගුණවත්කම් ගැන සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා කොට ඒ සියල්ල සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

## ආයාචනා කිරීම

මා හට සවන් දෙන මෙන්, මහා භාග්‍යවතුන් වහන්සේලාගේ පර්ෂදයෙන් ඉල්ලා සිටිමි.
සත් බුදුවරයන්වහන්සේලාණෙනි, ඔබවහන්සේලා ප්‍රතිඥා දුන් පරිදිම
මුලින් කළ ඔබගේ ප්‍රාර්ථනයන් ඉෂ්ට වන්නේය.
ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේලාගේ ඉගැන්වීම්වල අවසාන සමය තුළදී
එය සත්‍ය බව සැබවින්ම පෙන්වා දෙන ලෙස ඉල්ලමි.

## භෛෂජ්‍යගුරු බුදුන්වහන්සේලාට වෙන වෙනම ආයචනා කිරීම

මම, සුපරිකීර්තික - නාම - ශ්‍රීරාජ - භගවත්, තථාගත, අර්හත් සම්‍යක් සම් බුද්ධයන්වහන්සේට දණ්ඩ නමස්කාර කරමි. දාන වස්තූන් පූජා කරමි, උන්වහන්සේ සරණ යමි.

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා මා සහ සියලු ජීවී සත්වයින් මත මේ මොහොතේම පරිණත බවට පත්වී (ඉෂ්ට වී) යාවා, මගේ පවිත්‍ර ආයාචනා සියල්ල මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා.
රන්වන් පැහැය සහ පිහිට ලබා දීමේ මුද්‍රාව සහිත ප්‍රාර්ථනා අටක් ඉෂ්ට කර ගත්තාවූ............ අනගිභවනීය බුද්ධ ක්‍ෂේත්‍රයෙහි කීර්තිධර වූ සූපරිකීර්තික නාම ශ්‍රී රාජයන් වහන්සේට නමස්කාර කරමි.

දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ නැමති පුෂ්පයන්ගෙන් ද, ආරෝහ පරිණාහ දේහය වැනි අසූ අනුව්‍යංජනයන්ගෙන් ද අලංකෘත වූ ඔබ දකින, ඔබ ගැන අසන, සිතන පුද්ගලයා කීර්තිධර වේ, සුපරිකීර්තිත නාම ශ්‍රී රාජ යන්වහන්සේට නමස්කාර කරමි. මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන් සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන් නිකුත් වන්නට සලස්වමි. (විස්තෘත දාන වස්තු ගැන භාවනා කරන්න.) මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා පාපෝච්චාරණය කරමි, ගුණවත්කමේ ගැන සතුටුවෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.) මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා, කොට ඒ සියල්ල සම්මා සම් බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි. ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන් එය ප්‍රකාශ කිරීමේ, මතකයට නඟා ගැනීමේ, දණ්ඩ නමස්කාරයේ හා පූජාවේ බලයෙන් අප වැනි සියලු ජීවි සත්ත්වයෝ සාගතයෙන් ද, ඝාතනයන්ගෙන් ද, අපරාධකරුවන්ගෙන් ද, භූතයන් ගෙන් ද නිදහස් වෙත්වා.

ඔවුන්ට සම්පූර්ණ පසිඳුරන් ඇතිවේවා,

ඔවුන්ගේ දුක් වේදනාවල හා අශුභවාදී ලක්ෂණවල පැවැත්ම සිඳීයේවා.
ඔවුහු පහත් උත්පත්තියකට නොවැටෙත්වා.
ඔවුන්ට මිනිසුන්ගේ හා දෙවියන්ගේ සතුට අත්දකින්නට ලැබේවා.
සා පිපාසා හා දුගී බව සමනය කරමින් ධනය ඇතිවේවා.
බන්ධන හා තාඩන පීඩන වැනි ශාරීරික වධ වේදනා නොමැතිව,
කොටියන්, සිංහයන් හා සර්පයන්ගෙන් හානි ඇති නොවී,
අරගල සමනය වී ආදරබර මනස් වලින් යුතුව,
ගංවතුර බිය ද තුරන් කොට දමා
නිර්භය වූ සුඛස්ථානයට එළඹීමට අපට හැකි වේවා.
අප මෙම ජීවිතය පසු කොට (පරලොව) යනවිට,
පාරමිතා සම්පූර්ණව, එම බුද්ධ ක්ෂේත්‍රයේ
නෙළුමක් මත ඉපදී,
සුපරිකීර්තිත නාම ශ්‍රී රාජයන්වහන්සේ මෙන්
ජිනවරයන්වහන්සේගේ ඉගැන්වීම් පතුරුවා හැරීම සඳහා
යානයක් බවට පත්වී
උන්වහන්සේලාගේ සතුටට හේතුවක් වීමට අපට හැකි වේවා.

භාග්‍යවත්, තථාගත, අරහත් සම්‍යක් සම්බුද්ධ
උද්දීප්ත උපාය කෞශල්‍යයෙන් යුතු වූ ද
රත්නයන්ගෙන් චන්ද්‍රයාගෙන් හා පද්මයෙන් අලංකෘත වූ ද
භාග්‍යවත්, තථාගත, අර්හත් සම්‍යක් සම්බුද්ධ
ස්වරඝෝෂ රාජයන්වහන්සේට මම නමස්කර කරමි,
පූජා පවත්වමි, උන්වහන්සේ සරණ යමි.

*　　*　　*

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා, මා හා
සියලු ජීවි සත්වයන් මත මේ මොහොතේම

පරිණත බවට පත්වී (ඉෂ්ට වී) යාවා.
මගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා.

* * *

කහ පැහැයෙන් හා පරම තත්ව - දාන මුද්‍රාවෙන් යුතු වූ ද,
ප්‍රාර්ථනා අටක් මුදුන්පත් කළා වූ ද,
කුශල ප්‍රඥා දෙකෙන් අගතැන්පත් වූ ද
රත්න සංචිත බුද්ධ ක්ෂේත්‍රයේ, කීර්තිධරයන් වූ ද
ස්වර ඝෝෂ රාජයන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

මාණික්‍යමය චන්ද්‍රයාගෙන් හා පද්මයෙන් අලංකෘත වූ ද,
සියලු ජානනීය වස්තූන් පිළිබඳ විශාරදත්වය නිසා,
පැතිරුණු ප්‍රඥාවෙන් යුතු වූ ද
සාගර සමාන චිත්ත ස්වභාවයකින් සජ්ජිත වූ ද
ස්වර ඝෝෂ රාජයන්වහන්සේට මම නමස්කාර කරමි.
මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වමි
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා
පාපොච්චාරණය කරමි, ගුණවත්කම් ගැන
සතුටු වෙමි (සතුටු වීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා කොට,
ඒ සියල්ල සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.
ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ,
දණ්ඩ නමස්කාරයේ සහ පූජාවේ බලයෙන්
අප වැනි සියලු ජීවි සත්වයන් කෙරෙන්
දුකට පත් වූවෝ ධර්මයෙන් සැනසෙත්වා,
දෙව්මිනිසුන්ගේ ධන ධාන්‍ය ලබත්වා,

දුකක් නොවී පිළිසිඳගෙන,
සැම විටම මිනිසුන් වී උපදිත්වා,
කිසි විටෙකත් බෝධි චිත්තයෝ වෙන් නොවෙත්වා,
සද්ගුණ ධර්මයන් වර්ධනය කර ගනිත්වා,
නීවරණයන් පවිත්‍ර කොට දෙවිමිනිසුන්ගේ සතුට ලබත්වා !

* * *

අපගේ ආධ්‍යාත්මික නියමුවාණන්ගෙන්
වෙන් වී සිටීමට නොලැබේවා,
අඳුරු යුගයන්ගෙන් ද, භූත බලපෑම්වලින් ද, මරණයෙන් ද
සතුරන්ගෙන් ද, හුදකලා පෙදෙස්වල අනතුරුවලින් ද නිදහස් වේවා,
පූජා පැවැත්වීමට හා ආගමික වතාවත් කිරීමට උනන්දුව ඇති වේවා,
සාමාන්‍ය ජීවි සත්වයෝ ද සමාධිය, යහපත් සිහිය,
ශක්තිය, අමතක නොවීමේ ධාරණිය, හා
පරම ප්‍රඥාව ලබත්වා, දුක් ගිනි නිවී සිසිල් වේවා.

* * *

අප මෙලොවින් වෙනස්ව ගිය විට
පුණ්ඩරීක බුද්ධක්ෂේත්‍රයේ නෙළුමක් මත
සියලු රංගලක්ෂණවලින් පරිපූර්ණව
උපදින්නට අපට ලැබේවා.

* * *

ස්වර සෝෂරාජ වැනි ජිනවරයන්වහන්සේලාගේ
ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීම සඳහා
වාහකයක් වීමට අපට ලැබේවා.
උන්වහන්සේලාට එය සතුටක්ම වේවා !

* * *

භාග්‍යවත්, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
සුවර්ණභද්‍ර විමල තථාගතයන්වහන්සේට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

* * *

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා මා හා සියලු ජීවී සත්ත්වයන් මත
මේ මොහොතේම පරිණත බවට පත් වී (ඉෂ්ට වී) යාවා.
මාගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා.

* * *

ජාම්බූනාද රත්රන් වැනි ස්වර්ණ වර්ණයෙන් හා
ධර්මදේශනා මුද්‍රාවෙන් අලංකෘත වූ ද
සිවුවැදෑරුම් ප්‍රාර්ථනාවන් ඉෂ්ට කළා වූ ද,
කුශල, ප්‍රඥා ද්වය සංචිතයේ මහිමයෙන්
මහේශාක්‍ය බවට පැමිණියා වූ ද,
ධූප - පූර්ණ බුද්ධ ක්ෂේත්‍රයේ කීර්තිධරයාණන් වූ ද
සුවර්ණභද්‍රවිමලයන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

රත්රන් වර්ගවලින් උත්තම වූ ජාම්බූනද ස්වර්ණයමෙන්
හිරු දහසක් පැයූ කලක වැනි දීප්තියකින් බබලන්නා වූ,
ඝන රන් ස්තූපයක් වැනි සිරුරකින් හෙබියා වූ
සුවර්ණභද්‍ර විමලයන් වහන්සේට මම නමස්කාර කරමි.

* * *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා
පාපොච්චාරණය කරමි, ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා කොට
ඒ සියල්ල සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්,
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ
දණ්ඩ නමස්කාරයේ සහ පූජාවේ බලයෙන්
අප වැනි සියලු ජීවි සත්වයන් කෙරෙන්,
කෙටි ආයුෂ ඇත්තෝ දීර්ඝායුෂ ලබත්වා,
දුගී දුප්පත් ඇත්තෝ  සුපිරි ධනවතුන් වෙත්වා,
සතුරු සිත් ඇත්තන් තුළ ආදර සිත් ඇති වේවා,
පුහුණුවේ යෙදී නොසිටීම නිසා
පහත් උත්පත්තීන්ට වැටෙන්නට සිදු නොවේවා.
අප අපගේ ප්‍රතිඥාවන්ගෙන් බැඳීයේවා,
කිසි විටෙකත් බෝධි චිත්තයෙන් තොරව සිටීමට නොලැබේවා !
අප මෙලොවින් වෙනස්ව ගිය විට,
පුණ්ඩරීක බුද්ධක්‍ෂෙත්‍රයේ නෙළුමක් මත,
සියලු අංග ලක්‍ෂණවලින් පරිපූර්ණව
උපදින්නට අපට ලැබේවා !
ස්වර ඝෝෂරාජ වැනි ජිනවරයන්වහන්සේලාගේ
ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීම සඳහා
වාහකයන් වීමට අපට ලැබේවා,
උන්වහන්සේලාට එය සතුටක්ම වේවා!

*   *   *

භාග්‍යවත්, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
අශෝකෝත්තම ශ්‍රී රාජ තථාගතයන්වහන්සේට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

* * *

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා මා හා සියලු ජීවිසත්වයන් මත
මේ මොහොතේම පරිණත බවට පත්වී (ඉෂ්ට වී ) යාවා,
මාගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා !

* * *

ලා රතු පැහැයෙන් හා භාවනාමය සංහිදියාවේ මුද්‍රාවෙන් යුතු වූ ද,
ප්‍රාර්ථනා සතරක් මුදුන්පත් කළා වූ ද,
කුශල, ප්‍රඥා දෙකෙන් අගතැන්පත් වූ ද,
අශෝක බුද්ධ ක්ෂේත්‍රයෙහි කීර්තිධරයන් වූ ද
අශෝකෝත්තම ශ්‍රී රාජයන්වහවන්සේට මම නමස්කාර කරමි.

* * *

දුකින් මිදුණා වූ ද, පරම සුඛයට පත් වූ ද
ජීවී සත්වයන්ගේ තුන් වසයන් (වූ රාග, ද්වේශ, මෝහයන්)
හා දුක් දොම්නස් සමනය කරන්නා වූ ද
සය විධ භූමීන්හි වෙසෙන ජීවින්ගේ ආරක්ෂකයාණන් වූ ද
කීර්තිධර වූ අශොකෝත්තම ශ්‍රී රාජයන් වහන්සේට
මම දණ්ඩ නමස්කාර කරමි.

* * *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වමි
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා
පාපෝච්චරණය කරමි. ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරධනා, ආයාචනා කොට
ඒ සියල්ලම සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

*　　*　　*

ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්,
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ,
දණ්ඩ නමස්කාරයේ හා පූජාවේ බලයෙන්
අප වැනි සියලු ජීවි සත්වයන් කෙරෙන්
කණගාටුව වැනි දේ සෑම විටම සමනය වේවා.
දීර්ඝායුෂ්ක, සතුටින් පිරි ජීවිතයක් ලැබේවා.
ජිනවරයන්වහන්සෙගේ ආලෝක ප්‍රභාවෙන්
අපායවල සුඛය හා සතුට වර්ධනය වේවා.
අපට භූත කරදර නොමැති උද්දීප්තියක් ද,
අලංකාරයක් ද, ධනයක් ද අත් වේවා,
අප එකිනෙකා කෙරේ ආදරය ඇති වේවා.
අසනීපවලින් තොර වේවා.

*　　*　　*

අප මිනිස් ලොවින් වෙනස්ව ගියවිට
අශෝකෝත්තම බුද්ධ ක්ෂෙත්‍රයේ නෙළුමක් මත
සියලු අංගලක්ෂණවලින් පරිපූර්ණව
උපදින්නට අපට ලැබේවා.

අශෝකෝත්තම ශ්‍රී රාජ වැනි ජිනවරයන් වහන්සේලාගේ
ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීම සඳහා
වාහකයන් වීමට අපට ලැබේවා
උන්වහන්සේලාට එය සතුටක්ම වේවා!

*　　*　　*

භාග්‍යවත්, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
ධර්මකීර්තිසාගර භාග්‍යවතුන්වහන්සේට
මම දණ්ඩනමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

*　　*　　*

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා, මා හා සියලු ජීවී සත්වයන් මත
මේ මොහොතේම පරිණත බවට පත්වී (ඉෂ්ට වී) යාවා,
මාගේ පවිත්‍ර ආයවනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා !

*　　*　　*

ලා රෝස පැහැයෙන් හා ධර්ම දේශනා මුද්‍රාවෙන් යුතු වූ ද,
ප්‍රාර්ථනා සතරක් මුදුන්පත් කළා වූ ද,
කුශල, ප්‍රඥා දෙකෙන් අගතැන්පත් වූ ද,
ධර්මවිජය - ධ්වජ බුද්ධ ක්ෂේත්‍රයෙහි කීර්ත්ධරයාණන් වූ ද
ධර්මකීර්ති - සාගර භාග්‍යවතුන්වහන්සේට මම නමස්කාර කරමි.

*　　*　　*

විරුද්ධවාදීන් ජය ගන්නා වූ මහා ධර්ම - ඝෝෂයක් ඇත්තා වූ ද,
සාගර සමාන ගම්භීර කථාවෙන් සජ්ජිත වූ ද,

ජීවී සත්‍වයන්ගේ දුක් නිරවශේෂයෙන් සමනය කළා වූ ද
ධර්මකීර්ති - සාගර භාග්‍යවතුන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වමි (විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුභවාදී කරණා
පාපොච්චාරණය කරමි, ගුණවත්කම් ගැන
සතුටුවෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයාචනා කොට
ඒ සියල්ලට සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

* * *

ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්,
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ,
දණ්ඩ නමස්කාරයේ හා පූජාවේ බලයෙන්,
අප වැනි සියලු ජීවී සත්‍වයෝ
සැම විටම පරිපූර්ණ දෘෂ්ටිය ද ශ්‍රද්ධා ව ද ඇති අය වෙත්වා,
''ධර්ම'' ශබ්දය (ඝෝෂය) අසන්නට ලබත්වා.
බෝධිචිත්තයෙන් සාරවත් වෙත්වා.
මූලාශයන් වෙනුවෙන් අපගේ අශුභවාදයන් අත හැරී යා වා,
ධනය වර්‍ධනය වේවා.
අපට ආදරයෙන් සෙනෙහසින් බැඳී සිටින්නට,
දිගු කල් ජීවත් වන්නට, තෘප්තිමත් වන්නට ලැබේවා !

* * *

භාග්‍යවත්, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
පරම - ප්‍රඥා - ධර්ම - සාගර අභිඥාරාජයන් වහන්සේට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

* * *

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා, මා හා සියලු ජීවි සත්වයන් මත
මේ මොහොතේදීම පරිණත බවට පත්වී (ඉෂ්ට වී) යාවා,
මාගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා !

* * *

හිරිගල් (කොරල්) පැහැයෙන් හා
පරමතත්ව - දාන මුද්‍රාවෙන් යුතු වූ ද,
ප්‍රාර්ථනා සතරක් මුදුන්පත් කළා වූ ද,
කුශල, ප්‍රඥා, දෙකෙන් අගතැන්පත් වූ ද,
රත්න - සාගර බුද්ධ ක්ෂෙත්‍රයෙහි කීර්තිධරයාණන් වූ ද,
අභිඥාරාජ භාග්‍යවතුන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

පිරිසිඳ ගැනීම උගහට වූ
ගම්භීර ධර්ම - ඥාන චිත්තයෙන් යුතු වූ ද,
පවිත්‍ර සත්‍ය භූමිය තුළ ක්‍රීඩාවෙහි යෙදෙන්නා වූ ද,
දැනගත යුතු සියලු දේ ඍජුව දකින්නා වූ ද
අභිඥාරාජ භාග්‍යවතුන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා
පාපෝච්චාරණය කරමි, ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා කොට
ඒ සියල්ලම සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

* * *

ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්,
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ,
දණ්ඩ නමස්කාරය හා පූජාවේ බලයෙන්,
අප වැනි සියලු ජීවී සත්ත්වයන් අතුරින්
විසුරුණු - චංචල සිත් ඇත්තෝ ද්වේශයෙන් තොර වෙත්වා,
ධන සම්පතින් ආඪ්‍ය බවට පැමිණෙත්වා.
පහත් ලෝකවලට යන පාපීමාර්ග අනුගමනය කරන්නෝ
දසවිධ සද්ගුණයන්ට (පුණ්‍ය ක්‍රියාවන්ට) පත් වෙත්වා.
අන්‍යයන් විසින් පාලනය කරනු ලබන්නෝ
පරිපූර්ණ ස්වාධීනත්වය ලබත්වා,
දීර්ඝායුෂ ලබත්වා, නාමයන් අසත්වා, ගුණවත් වෙත්වා.
අප මෙම මිනිස් ලොවින් වෙනස්ව යන විට,
රත්න - සාගර බුද්ධ ක්ෂෙත්‍රයේ නෙළුමක් මත
සියලු අංගලක්ෂණවලින් පරිපූර්ණව
උපදින්නට අපට ලැබේවා.
අභිඥාරාජ වැනි ජිනවරයන්වහන්සේලාගේ
ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීම සඳහා
වාහකයන් වීමට අපට ලැබේවා.
උන්වහන්සේලාට එය සතුටක්ම වේවා !

*   *   *

තථාගත, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
භෛෂජ්‍යගුරු වෛඩූර්ය - ප්‍රභ රාජ තථාගතයන් වහන්සේට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

*   *   *

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා, මා හා සියලු ජීවි සත්ත්වයන් මත,
මේ මොහොතේම පරිණත බවට පත් වී (ඉෂ්ට වී) යාවා,
මාගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා!

*   *   *

නිල් පැහැයෙන් හා පරම තත්ව - දාන මුද්‍රාවෙන් යුතු වූ ද,
ප්‍රාර්ථනා දොළහක් මුදුන්පත් කළා වූ ද,
කුශල, ප්‍රඥා දෙකෙන් අගතැන්පත් වූ ද,
වෛඩූර්ය - ප්‍රභ බුද්ධ ක්ෂේත්‍රයෙහි කීර්තිධරයාණන් වූ ද
භෛෂජ්‍යගුරු බුදුරජාණන්වහන්සේට මම නමස්කාර කරමි.

*   *   *

සෑම දෙනා කෙරෙහි සම මෙත පතුරුවන බුදු කෙනෙකුන් වූ
(උන්වහන්සේගේ) ශ්‍රී නාමය ඇසුණු පමණින්
අපාය භූමින් හි දුක තුරන් කරන්නාවූ ,
අසනීප ද, රාග, ද්වේශ, මෝහ ද දුරු කරන්නා වූ
භෛෂජ්‍ය ගුරු වෛඩූර්ය ප්‍රභ තථාගතයන් වහන්සේට
මම නමස්කාර කරමි.

*   *   *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත්වන්නට සලස්වන්නෙමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා
පාපෝච්චාරණය කරමි, ගුණවත්කම ගැන
සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයචනා කොට
ඒ සියල්ලම සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

*   *   *

ජිනවරයන්වහන්සේගේ ශ්‍රී නාමය ඇසීමේ බලයෙන්,
එය ප්‍රකාශ කිරීමේ, මතකයට නගා ගැනීමේ,
දණ්ඩ නමස්කාරයේ හා පූජාවේ බලයෙන්
අප වැනි සියලු ජීවි සත්වයෝම
ඔබවහන්සේ මෙන් සියලු අංගලක්‍ෂයන්ගෙන්
ශෝභමාන වෙත්වා.

*   *   *

අඳුර දුරු කරන ආලෝකයද ප්‍රඥාවේ වින්දනය ද,
උපාය කෞශල්‍ය මාර්‍ගයන් ද සිඳී නොයාවා !
වැරදි හා පහත් මාර්‍ගයන් වෙත ඇදී ගිය ඇත්තෝ,
මහායාන මාර්‍ගයන්ට ඇතුළු වෙත්වා !
සියල්ලෝම තම ප්‍රතිඥාවන් නිසා අලංකාර වෙත්වා !

*   *   *

දුරාචාරය හේතුවෙන් ඇතිවූ වේදනාවෙන් අප නිදහස් වේවා.
පරිපූර්ණ ඉන්‍ද්‍රියයන් ඇති වේවා, අසනීප වලින් තොර වේවා,
ධන සම්පත් බහුල වේවා !

දුර්වල තත්වයේ සිට (ධර්ම) අනාවරණය ලැබූ අයට හැම විටම ශක්තිමත් ඉන්ද්‍රියයන් ලැබේවා.
මාර බන්ධනයෙන් හා විකෘත දෘෂ්ටීන්ගෙන් මිදේවා !
රජුන්ගේ තාඩන පීඩනවලට ලක්වූ අය සුඛයට පැමිණෙත්වා,
කුසගින්න නිසා වැරදි මාර්ගවලින් යැපෙන අය,
ධර්මයට අනුව (ධර්මානුකූලව) ලැබෙන අහරින් තෘප්තිමත් වෙත්වා,

උෂ්ණයෙන් සහ සීතලෙන් පැමිණෙන අපහසුතා දුරුවී,
යහපත් අපේක්ෂා සියල්ල මුදුන්පත් වේවා !
ආර්යයන් සතුටු වන ආකාරයේ සදාචාරයෙන් යුතු අපට,
විමුක්තිය ලැබේවා.

* * *

අප මෙම මිනිස් ලොවින් වෙනස්ව ගිය විට,
වෛඩූර්ය - ප්‍රභා බුද්ධක්ෂේත්‍රයේ නෙළුමක් මත
සියලු අංගලක්ෂණවලින් පරිපූර්ණව
උපදින්නට අපට ලැබේවා,
භෛෂජ්‍ය ගුරු වැනි ජිනවරයන්වහන්සේලාගේ
ඉගැන්වීම් සම්ප්‍රේෂණය කිරීම සඳහා
වාහකයන් වීමට අපට ලැබේවා.
උන්වහන්සේලාට එය සතුටක්ම වේවා!

* * *

භගවත්, අර්හත්, සම්‍යක් සම්බුද්ධ
කීර්තිධර, ජිනවර, ගෞතම ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
උන්වහන්සේ සරණ යමි.

* * *

ඔබවහන්සේ දුන් ප්‍රතිඥා, මා හා සියලු ජීවිසත්ත්වයන් මත
මේ මොහොතේම පරිණත බවට පත් වී (ඉෂ්ට වී) යා වා,
මාගේ පවිත්‍ර ආයාචනා සියල්ලම
මේ මොහොතේම සාර්ථක ප්‍රතිඵල ලබාවා !

* * *

රන් පැහැයෙන් හා භූමි ස්පර්ශ මුද්‍රාවෙන් යුතු වූ ද,
අද්විතිය මහා කරුණාව හා උද්යෝගය හරහා
මෙම අභීත චක්‍රවාටයෙහි කීර්තිධරයාණන් බවට පත් වූ ද
පරම නායික ශාක්‍යමුනීන්ද්‍රයන්වහන්සේට
මම නමස්කාර කරමි.

* * *

උපාය කෞශල්‍යයෙන් හා කරුණාවෙන් යුතුව
ශාක්‍ය වංශයෙහි උපන්නා වූ ද
අනගි භවනීය වූ හා මාර බලවේග ජයගත්තා වූ ද,
ස්වර්ණවර්ණ මේරූ පර්වතය වැනි මහේශාක්‍ය ශරීරයකින් යුතු වූ ද
ශාක්‍යරාජයාණන්වහන්සේට මම නමස්කාර කරමි.

* * *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත් වන්නට සලස්වන්නෙමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුභවාදී කාරණා
පාපොච්චාරණය කරමි, ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටු වීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරධනා, ආයාචනා කොට
ඒ සියලුම සම්හි සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

* * *

අප කෙරේ කරුණාවෙන්, ආරක්‍ෂකයෙකු නොමැති
සියලු ජීවි සත්වයන්ට හා අපටද,
පරම ගුරු උතුමාණන් විසින්
භෛෂජ්‍ය ගුරු විස්තෘත පූජා සූත්‍රයෙහි
උගන්වා ඇති ආකාරයෙන් සියලු ප්‍රතිලාභයන්
පූර්ණ වශයෙන් හා වහාම ලබා ගැනීම සඳහා,
ආශීර්වාද කරන සේක්වා !

*　*　*

## දණ්ඩ නමස්කාරය හා ශුද්ධ වූ ධර්මයට ආයාචනා කිරීම

අවිඳු අඳුර දුරලන පරම (දීපය) පහන වූ ද,
ලෙඩ දුක් සමනය කරන උත්තම බෙහෙත වූ ද,
උතුම් වූ සමස්ත ධර්ම රත්නයට
මම නමස්කාර කරමි, පූජා පවත්වමි,
ධර්ම රත්නය සරණ යමි.

*　*　*

දුකෙහි හේතුව වූ අන්ධකාර බීජය
සම්පූර්ණයෙන්ම විනාශ කර දමන්නා වූ ද,
දුකෙහි වේදනාව මුලිනුපුටා දමන්නා වූ ද,
ජිනවරයන්ගේ මාතෘවරිය වූ ද
ප්‍රඥා පාරමිතාවට හා ශුද්ධ වූ ධර්මයට
නමස්කාර වේවා.

*　*　*

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්,
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්,
නිකුත් වන්නට සලස්වන්නෙමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුබවාදී කාරණා

පාපොච්චාරණය කරමි. ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටු වීම ගැන භාවනා කරන්න.)
මෙයන් සියලු සද්ගුණයන්ට ආරාධනා, ආයාචනා කොට
ඒ සියල්ලම සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි.

* * *

ශුද්ධ වූ ධර්ම රත්නයේ සත්‍යයෙහි ආශීර්වාදයෙන්
මටද, අන් සියල්ලන්ට ද අපගේ සියලු ජීවිත කාල තුළදී
බුදුන්වහන්සේගේ ඉගැන්වීම්, උන්වහන්සේ අදහස් කළ ආකාර
යටම ප්‍රගුණ කරන්නට ලැබේවා.

* * *

## පුහුණුවේ ප්‍රතිලාභ සඳහා ආයාචනා කිරීම

ජිනවරයන්වහන්සේලාගේ හෘද කැපවීම් වෙනුවෙන් මංජු ශ්‍රී, ක්‍යාබ් ද්‍රොල් සහ වජ්‍රපාණී ඇතුළු තිස් දහසක් සුගත පුත්‍රයන් විසින් ආයාචනා කරන ලද්දේය.
එසේ ආයාචිත උන්වහන්සේලා,
මෙම සූත්‍රයේ ප්‍රතිලාභ ප්‍රකාශයට පත් කළහ.
කරුණාකර ඒවා මෙතැන, මේ මොහොතේ
මා ඉදිරියේ ප්‍රාදූර්භූත වන්නට සලස්වනු මැනවි.
ඔබවහන්සේ පූර්ව ගුරු උතුමන්ලා ඉදිරියේ
පොරොන්දු වූ ආකාරයට
ලෞකික ආරක්ෂක යක්ෂරාජයන්ට ද
ආයාචනා කරන්නේ
සතුරන් ද, හිංසකයන් ද, වසංගතයන් ද නවත්වා,
සියලු ගැටුම් සමනය කොට,
භෞතික හා මානසික සුඛය වර්ධනය කොට,
ධනය ද, බලය ද, වස්තුව ද, ධාන්‍ය ද වර්ධනය කොට
අප කැමති ආකාරයෙන් අපගේ අරමුණු මුදුන්පත් කොට දී
සෑම විටම නොකඩවා අප ආරක්ෂා කරන ලෙසය.

*   *   *

## මන්ත්‍ර සජ්ඣායනය

ඕං නමෝ භගවතේ භෛෂජ්‍යගුරු
වෛඩූර්ය - ප්‍රභ රාජාය තථාගතා යාර්හතේ
සම්‍යක් සම්බුද්ධාය තද්යථා ඕං
භෛෂජ්‍යෙ භෛෂජ්‍යෙ (මහා) භෛෂජ්‍යරාජ
සමුද්ගතේ ස්වාහා

*   *   *

## කෙටි මන්ත්‍රය

තද්යථා ඕං භෛෂජ්‍යෙ භෛෂජ්‍යෙ
(මහා) භෛෂජ්‍යරාජ සමුද්ගතේ ස්වාහා.

*   *   *

අසමසම කරුණාවෙන් යුතු මූල ගුරු උතුමාණන්ට ද
මෙම ගම්භීර සූත්‍රය අතෙහි දරාගෙන සිටින
ශාක්‍ය - රාජ, මංජු ශ්‍රී, ශාන්තරක්ෂිත ආදීන්ට ද,
සෘජු හා පරම්පරා ගුරු උතුමන්වහන්සේලාට ද
මම (දණ්ඩ) නමස්කාර කරමි.
අසරණ ජීවි සත්වයන් විමුක්තියට පත් කරන
මහාකාරුණිකයාණන්ටත්,
සත් බුදුවරයන් වහන්සේලාටත්,
ශාක්‍යමුනි බුදුන්වහන්සේටත්,
ශුද්ධ වූ ධර්මයටත්,
මංජු ශ්‍රී, ක්‍යබ් ද්‍රොල්, වජ්‍රපාණී, බ්‍රහ්ම, ඊශ්වර
යන අයටත්, මහාරාජාවරුන්ට හා යක්ෂයන්ටත්
මම නමස්කාර කරමි.

*   *   *

මන්ත්‍රයේ, සමාධියේ හා ප්‍රාර්ථනාවේ බලයෙන්
සෑම පූජා සංචිතයක්ම සැබෑ ආකාරයෙන්
නිකුත්වන්නට සලස්වන්නෙමි.
(විස්තෘත දානවස්තු ගැන භාවනා කරන්න.)
මම සියලු පරාජයන් සහ අසුභවාදී කාරණා
පාපෝච්චාරණය කරමි. ගුණවත්කම් ගැන
සතුටු වෙමි. (සතුටුවීම ගැන භාවනා කරන්න.)
මෙවන් සියලු සද්ගුණයන්ට ආරාධනා ආයාචනා කොට
ඒ සියල්ලම සම්මා සම්බුද්ධත්වය වෙනුවෙන් කැප කරමි !

*  *  *

## සමාව දෙන ලෙස ඉල්ලා සිටීම

සුදානම් නොවී හෝ පහත් ලෙස හෝ
මුළා වූ මනසකින් මා විසින් කරන ලද හෝ
කිරීමට සලස්වන ලද යම් දෙයක් වේ නම්
ඒ සියල්ලටම සමාව දෙන ලෙස,
ඒ සියල්ල ඉවසන ලෙස ඉල්ලා සිටිමි.

*  *  *

මෙම පිරිහෙන යුගයේදී ජීවි සත්ත්වයන්
අවිද්‍යාවෙන්, මුළාවී, පහත් මට්ටමින්,
ආර්යයන්ගෙ අපේක්ෂාවන් ඉටු නොකරන ලෙස
කළ යම් ක්‍රියාවක් ඇත්නම්,
ඒ සියල්ලටම ද සමාව දෙන ලෙස ඉල්ලා සිටිමි.

*  *  *

මසුරු කමේ බලපෑමෙන්, අදක්ෂ ලෙස,
වැරදි පිළිවෙලකට හෝ නුසුදුසු මට්ටමේ හෝ
දාන වස්තූන් පූජා කරන ලද්දේ නම්,

මහා කරුණාවෙන් හෙබි ආරක්ෂකයාණෙනි,
ඒ සියල්ලට කමා කරන සේක්වා !

*    *    *

පමණ වඩා වැඩි නිසා හෝ, නොකර අත්හළ නිසා හෝ
පූජාවේ කොටසක් අසම්පූර්ණ වී පිරිහී ගියහොත්,
එසේ නැත්නම් යම් දෙයක් අමතක වී ගියහොත්,
ඒ සියල්ලම ඉවසා වදාරන සේක්වා !

## රැඳී සිටීම සඳහා ආයාචනයි

සසර සැරිසරන්නේ සියලු දෙනා වෙනුවෙන්
මෙම පිළිමය සමඟ මෙහි රැඳී සිටීමෙන්,
ඔබ වහන්සේ අපට අසනීප රහිත දීර්ඝායුෂ ද,
බලය ද, පරම මස්තක ප්‍රාප්තියද ප්‍රදානය කරන සේක්වා !

''ඕං සුප්‍රතිෂ්ඨිත වජ්‍රයේ ස්වාහා''

*    *    *

## ශුභ ගායනා

අවකාශයේ සියලු දිසා සිසාරා
පරිපූර්ණ පාරමිතා සහිතව වැඩ සිටින
භෛෂජ්‍යගුරු බුද්ධ දේවතා මණ්ඩලයන් අතුරින්
සමහර මණ්ඩලවල දේවතාවෝ වෛවර්ණ නෙළුම් මල් වැසි වස්වති,
සමහර දේවතාවෝ යහපත අයදිමින් ගීත ගයති,
සමහර දේවතාවෝ, මාරයන් හා බාධක
ජය ගැනීමට ක්‍රියා කරති,
ඒ සියල්ලෝම ඔබ වෙත
පරම සෞභාග්‍යය පිරිනමන්නේය.
එය හොඳින් දැන අප්‍රමාණ සතුටින් යුතු වන්න.
ශුභදායක බව ප්‍රකාශ කරමින් මම ගීයක් ගයමි.

*　　*　　*

දෙවිමිනිසුන්ගේ පරමගුරු උතුමාණෙනි,
මගේ සිරස ඔබගේ රත්න චන්ද්‍රා ලෝකයෙන් ඔප්නැංවුණු
පාද යුග්මයෙහි ස්පර්ශ වීම ම
පිපෙන කුමුදු මලක, සෞභාග්‍ය සම්පන්න
විභූතිය දානය කරන්නකි.
දේශක - චන්ද්‍ර වූ මුනීන්ද්‍රයන්ට
මම නමස්කාර කරමි.

*　　*　　*

මංජුශ්‍රී සහ මහෝපාධ්‍යාය ශාන්තරක්ෂිත,
ත්‍රී සොං දෙත්සන්, අතීශ පිය - පුතුන්,
ද්විතිය ජිනවර ලොසං ඩුග්පා ආදී කොට ඇති,
පරම මූලගුරු උතුමන්ගේ හා පරම්පරා ගුරු උතුමන්ලාගේ
සියලු සද්ගුණ සංචිතයන්ගේ වාසනා මහිමයෙන් සමස්ත පරිහා-
නිය හා අශුභවාදිත්වය අවසන් වේවා,
මෝරන සඳ සේ යහගුණය හා සුඛය වර්ධනය වෙමින්
පාරමිතා පරිපූර්ණත්වයේ මහිමය වින්දනය කිරීම
ශුභ මංගල්‍යය කාරණයක්ම වේවා!

*　　*　　*

සත්‍යය මතුකර ගැනීමේ පරම ආයවනා සාගරයක් මුදුන්පත් කරන
ධර්ම ඉගැන්වීම් පිරිහෙන යුගයේදී
වෙනත් සූර්ය සමාන ජිනවරයන් අතින් දමනය නොවූ
අනාරක්ෂිත ජීවී සත්වයන් සඳහා,
සත් බුදුවරයන්වහන්සේලාගේ හා ආරක්ෂකයන්ගේ
සියලු සද්ගුණ සංචිතයන්ගේ වාසනා මහිමයෙන්
සමස්ත අශුභවාදිත්වය හා පරිහානිය අවසන් වේවා,
මෝරන සඳ සේ යහ ගුණය හා සුඛය වර්ධනය වෙමින්
පාරමිතා පරිපූර්ණත්වයේ මහිමය විඥානය කිරීම

ශුභ මංගල්‍ය කාරණයක්ම වේවා!

*  *  *

ශූර ස්වාමීන්ගේ නෙළුමක් බඳු පුළුල් දිවෙන් පැන නැගී,
ශාක්‍යයන්ගේ පසු කාලීන ඉගැන්වීම්වල වූව
විශේෂ උත්තුංග භාවයට පත්
ක්‍රියාත්මක කළ හොත් අමරණීයත්වයේ
අමෘත සාරය ලබා දෙන්නා වූ
විස්තීර්ණ වූ ද ගම්භීර වූ ද සූත්‍ර පිටක රාජයාගේ
සියලු සද්ගුණ සංචිතයන්ගේ වාසනා මහිමයෙන්
සමස්ත අශුභවාදිත්වය හා පරිහානිය අවසන් වේවා.
මෝරන සඳ සේ යහගුණය හා සුඛය වර්ධනය වෙමින්,
(පාරමිතා) පරිපූර්ණත්වයේ මහිමය වින්දනය කිරීම
ශුභ මංගල්‍ය කරණයක්ම වේවා!

*  *  *

දස දිසාවන්හිම ඇති සියලු භූමීන්හි වෛද්‍යරාජයන්ගේ
භුදු නාමයන් සජ්ඣායාන කිරීමෙන් හා
විශේෂයෙන් ගුරු බුද්ධයන් හා සුගතයන් වහන්සේලාගේ
විස්තෘත ආයාචනා මගින්
සූත්‍ර පූජාවන් පවත්වන පරම්පරා දරුවන්ගේ
සියලු සද්ගුණ සංචිතයන්ගේ වාසනා මහිමයෙන්
සමස්ත අශුභවාදිත්වය හා පරිහානිය අවසන් වේවා.
මෝරන සඳ සේ යහ ගුණය හා සුඛය වර්ධනය වෙමින්
(පාරමිතා) පරිපූර්ණත්වයේ මහිමය වින්දනය කිරීම
ශුභ මංගල්‍ය කාරණයක්ම වේවා.!

*  *  *

සුගතයන්වහන්සේලාගේ කරුණා මන්ත්‍රයෙන් ද,
ශ්‍රද්ධාවෙන්, සමාධියෙන් හා සත්‍ය වචනයෙන් ද,
මාණික්‍ය නිර්මාණයෙන් ද මස්තක ප්‍රාප්ත කරගත්

තුන් ලෝකයෙන් ඔබ්බේ පවතින ත්‍රිවිධ රත්නයේ වාසභවනය වූ
සුඛාවතිය භාසමාන පරම බුද්ධ ක්‍ෂෙත්‍රයේ
සියලු සද්ගුණ සංචිතයන්ගේ වාසනා මහිමයෙන්
සමස්ත අශුභවාදීත්වය හා පරිහානිය අවසන් වේවා,
මෝරන සඳ සේ යහගුණය හා සුඛය වර්ධනය වෙමින්
(පාරමිතා) පරිපූර්ණත්වයේ මහිමය වින්දනය කිරීම
ශුභ මංගල්‍ය කාරණයක්ම වේවා !

## කැප කිරීම් ආයාචනා

මෙම පුණ්‍ය ක්‍රියා නිසා රැස්වන කුසලයන්ගේ බලයෙන්
ඉක්මනින්ම ගුරු බුද්ධයන්ගේ තත්වයට පත්ව
සියලුම ජීවි සත්වයන් ද එම තත්වයට
පත් කිරීමට මට හැකිවේවා.

* * *

පැන නොනැගුණු බෝධි චිත්ත රත්නය
පැන නැගී වර්ධනය වේවා,
පැන නැගුණු බෝධි චිත්තය මිලින නොවී
වඩ වඩාත් වර්ධනය වේවා.

* * *

නිර්භීත වූ සමන්තභද්‍රයන් හා මංජු ශ්‍රී ද
දේවල්වල ඇති සැටිය ප්‍රත්‍යක්‍ෂ කරගත් බැවින්
මමද පූර්ණ වශයෙන් ඔවුන් අනුව යාමට හැකිවන පරිදි
මෙම සියලු කුසලයන් හොඳම ආකාරයෙන් කැප කරන්නෙමි.

* * *

තුන් කාලයේ ජිනවර තථාගතයන්වහන්සේලා විසින්

ඉතා හොඳ යයි වර්ණනා කරන ලද්දාවූ කැප කිරීමෙන්
මා මෙම සියලු කුසල මූලයන් කැප කරන්නේ,
යහපත ක්‍රියාවල යෙදිය හැකි වන පරිද්දෙනි.

* * *

තුන් කල්හිදීම මා විසින්ද සියලුම බුද්ධ - බෝධිසත්‍වයන් වහන්සේලා විසින් ද, කර ගන්නා ලද, ඒ අයගේ පැත්තෙන් ශූන්‍ය වූ, කුසලවන් ගේ බලයෙන්, ඒ පාර්ශවයෙන් ශූන්‍ය වූ මට ද, ඒ පාර්ශවයෙන් ශූන්‍ය වූ බුද්ධ තත්වය සාක්‍ෂාත් කිරීමට ලැබේවා. ඔවුන්ගේ පාර්ශවයෙන් ශූන්‍ය වූ සියලුම ජීවි සත්වයින් හැකි ඉක්මණින් එම (බුද්ධ) තත්‍වය කරා ගෙන ඒමට මටම හැකි වේවා! තුන් කල්හිදීම මා විසින් ද, බුද්ධ බෝධිසත්වයන්වහන්සේලා විසින්ද, සියලු ජීවි සත්‍වයන් විසින් ද රැස්කර ගන්නා ලද කුසලයන්ගේ බලයෙන්, යුද්ධ, සාගත, වසංගත, කෝලාහල, සටන් හෝ නොසතුටු මනස් ඇති නොවේවා, මහත් සෞභාග්‍යයක් ඇති වේවා, අවශ්‍ය සියලු දේ පහසුවෙන් ලබාගත හැකි වේවා. මුළු ලෝකයේම මනුෂ්‍යයෝ, ධර්මය පමණක් උගන්වන ආධ්‍යාත්මික නායකයන් විසින් මඟ පෙන්වනු ලබත්වා. සැම දෙනාම දහමේ සතුට වින්දනය කරත්වා !